**කාර්මික තාක්ෂණ ආයතනය**

-------------------------------

1. **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

**මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කාර්මික තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

------------------------------

**පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.**

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 9 ට අනුව පහත අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.**

(i) **මාස 03කට වැඩි කාලයකින් කල් පිරෙන රු.10,200,000 ක වටිනාකමකින් යුත් ස්ථාවර තැන්පතු, මුදල් හා මුදල් සමාන දෑ ලෙසට අනුචිතව දක්වා තිබුණි.**

(ii) **රු.2,032,888 ක් වූ ස්ථාවර වත්කම් විකිණීමෙන් වූ ලාභය රු.2,278,888 ක් ලෙස මෙහෙයුම් ලාභයට වරදවා ගලපා තිබුණි.**

(iii) **රු. 16,630,703 ක් වූ ස්ථාවර වත්කම් කපාහැරීමේ පිරිවැය හා රු. 18,434,417 ක් වටිනා ස්ථාවර වත්කම් කපාහැරීමේ ක්ෂය වීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහයන්ට අනුචිත ලෙස පෙන්වා තිබුණි.**

(iv) **කාරක ප්‍රාග්ධන ගැළපීම් වල විචලනයන් පහත අයුරින් සාවද්‍ය ලෙස ගලපා තිබුණි.**

| | 2011 | 2010 | **නිවැරදි වෙනස** | **මුදල් ප්‍රවාහයේ පෙන්වා තිබ ශේෂය** |
|---|---|---|---|---|
| | ------- | ------ | ---------------- | --------------------- |
| | රු: | රු: | රු: | රු: |
| **උපචිත වියදම්** | 18,799,347 | 25,196,688 | 6,397,341 | 6,397,130 |
| **වෙළඳ හා ලැබිය යුතු ගිණුම්** | 52,097,906 | 53,192,352 | 1,094,446 | 1,818,115 |
| **ඉදිරි ගෙවීම්** | 1,663,441 | 2,882,653 | 1,219,212 | 1,218,999 |

(ආ) **ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ට අනුව 1999 ඔක්තෝබර් 28 දිනැති අංක 1103/18 දරණ ගැසට් නිවේදනය පරිදි සේවකයා සේවයට බැදී පළමු වසරේ ආරම්භයේ සිට පාර්තේෂික ප්‍රදාන ගණනය කොට ගිණුම්ගත කල යුතු වුවත් ආයතනයේ සම්පූර්ණ වසර 1 ක සේවා කාලය සම්පූර්ණ කල හා වසර 5 දක්වා සේවා කාලයක් ඇති සේවකයින් 73 දෙනෙක් වෙනුවෙන් 2011 වර්ෂය සඳහා රු.1,874,297 ක් අඩුවෙන් පාර්තෝෂික වෙන්කිරීම සිදුකර තිබුණි..තවද පාර්තෝෂික වෙන් කිරීම් රු.71,394,795 ක මුදල ආයෝජනය කිරීමක් ද කර නොතිබුණි.**

(ඇ) (i) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව රු.220,906,930 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීමට අදාල භූමියෙහි වටිනාකම ගිණුම්කරණ ප්‍රතිපත්ති වල අඩංගුකර නොතිබුණි.**

(ii) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ස්ථාවර වත්කම් භාවිතයට ගත් දිනයේ පටන් ක්ෂය කිරීම ආරම්භ කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු.60,482,365 වටිනා වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය ගණනය කල බැවින් රු.4,616,613 ක් වටිනා ක්ෂය වැඩිපුර ගිණුම් ගත කර තිබුණි.**

## 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

**පහත සඳහන් අඩපාඩු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ජංගම වත්කම් යටතේ දක්වා තිබූ පාරිභෝජන ද්‍රව්‍ය තොගය රු.10,217,790 ක් ලෙස දක්වා තිබුණ ද භෞතික සත්‍යාපන වාර්තාව ප්‍රකාරව එම ප්‍රමාණය රු. 10,013,436 ක් විය. මේ අනුව රු.204,354 කින් පාරිභෝජන ද්‍රව්‍ය තොගය ගිණුමෙහි වැඩිපුර දක්වා තිබුණි.

(ආ) වර්ෂ 5 කට වඩා වැඩි නොනිමි ප්‍රාග්ධන වැඩ වල වටිනාකම රු. 220,665 ක් ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ගෙවන ලද ජීවන වියදම් දීමනා රු. 16,869,495 කට අදාලව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් රු. 506,084 ක් ද සේවක අර්ථසාධක අරමුදල රු. 4,217,373 ක්ද අඩුවෙන් ගිණුම්වලට ගෙන තිබුණි.

(ඈ) යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ වර්ෂය තුළදී මිලදී ගත් ප්‍රමාණය රු.540,796 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) පුස්තකාල පොත් පරිහරණය සඳහා වාර්ෂික සාමාජිකත්වය අළුත්කිරීමේ ගාස්තු වශයෙන් විදේශීය ආයතනයකට 2011 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.3,744,204 ක මුදලක් වර්ෂයේ පුස්තකාල පොත් සඳහා වූ වියදම් වශයෙන් ප්‍රාග්ධනීත කර තිබුණි. මේ සඳහා රු.187,210 ක ක්ෂය වීම් ද ගිණුම් ගත කර තිබුණි.

(ඊ) 2010 දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් වල භෞතික ශේෂය රු.13,528,919 ලෙස දක්වා තිබුණ ද 2011 ජනවාරි 01 දිනට පුස්තකාල පොත් ආරම්භක ශේෂය ලෙස රු.71,479,135 ක් දක්වා තිබුණි. මෙම ශේෂය තුල පසුගිය වර්ෂ වලට අදාලව විදේශීය ආයතනය වෙත ගෙවා තිබූ වාර්ෂික සෘජු ප්‍රවේශ ගාස්තු(online access fee) ඇතුලත්ව තිබුණි.

1.2.3 **ලැබීමට ඇති ණය කාලය අනුව විශ්ලේෂණය**

| ණයගැති වර්ගය | ශේෂ පත්‍රයේ දිනට මුදල | කාල විශ්ලේෂණය (අවු) | | | | |
|---|---|---|---|---|---|---|
| | රු. | 1ට අඩු | 1-2 | 2-3 | 3-4 | 5ට වැඩි |
| විවිධ ණය ගැතියෝ | 9,662,212 | 2,089,326 | 835,684 | 1,245,612 | 397,766 | 5,093,824 |
| සේවක අත්තිකාරම් | 21,333,987 | 11,512,899 | 826,402 | 1,351,128 | 2,710,158 | 4,933,400 |
| තැන්පතු | 3,261,313 | 175,606 | 529,609 | 144,350 | 110, 500 | 2,301,248 |

1.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.**

| විස්තරය | වටිනාකම | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු | |
| ජංගම වගකීම් (ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පතු) | 83,339 | ශේෂ තහවුරු කිරීම් |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු තැන්පතු | 1,091,813 | ලදුපත්,ලිපි ලේඛන |
| ණයගැතියන් | 4,459,333 | ශේෂ තහවුරු කිරීම් |

**1.2.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරන තීරණ වලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

**පහත සඳහන් අනුකූල නොවු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.**

(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

| | |
|---|---|
| i II පරිච්ඡේදය 10:1 සිට 10:5 වගන්ති | රජයේ ස්ථිර තනතුරක් සඳහා නව පත්වීමක් ලබන නිලධාරියෙකු සිය පත්වීමට අදාල මුලික සුදුසුකම් ලෙස රජයේ වෛද්‍ය නිලධාරියෙකු යටතේ වෛද්‍ය පරීක්ෂණයකට යොමු වී ශාරීරික හා මානසික යෝග්‍යතාවය සහතික කරගත යුතු වුවද, ඊට පටහැනිව පෞද්ගලික ආරෝග්‍යශාලාවකින් එම යෝග්‍යතාවය පරීක්ෂා කර ගැනීම සඳහා රු.43,955 ක් ආයතනයෙන් වැය කර තිබුණි. |
| ii II පරිච්ඡේදය 9 වගන්තය හා 2011 නොවැම්බර් 16 දින අංක 24/2011 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව වයස අවුරුදු 60 ඉක්ම වු නිලධාරීන් දෙදෙනෙකු මාස හයක කාලයක් සඳහා සේවයට බඳවාගෙන රු.597,660 ක් ගෙවා තිබුණි. |
| iii XIV පරිච්ඡේදය හා 2006.02.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 iv | සංයුක්ත දීමනා ගෙවීමේදී නිලධාරී කාණ්ඩයන්ට අනුමත දීමනා ප්‍රමාණයන්ට පටහැනිව අභ්‍යන්තර චක්‍රලේඛයක් පදනම් කරගෙන රු. 600 බැගින් රු 31,200 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි මු.රෙ.104 | අලාභ හානියක් සිදුවූ වහාම එය තක්සේරු කිරීම සඳහා හා එයට වගකිවයුතු අය තීරණය කිරීම සඳහා පරීක්ෂණ සිදු කළ යුතු වුවද වාහන අනතුරු 03 කට අදාලව එලෙස කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1990 මාර්තු 09 දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව පුද්ගලික ආයතනයකින් සේවා පුරප්පාඩු සඳහා තාවකාලික සේවකයින් ලබාගෙන තිබුණි. |
| (ඈ) | 2003.06.02 දිනැති පීඑඩී 12 දරන චක්‍රලේඛයේ 9.10 වගන්තිය | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන උපදේශක තනතුරකට පත්කිරීම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය නොමැතිව 2009 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා මසකට රු.20,000 දීමනාවකට යටත්ව උපදේශකවරුයෙකුගේ සේවය ලබා ගෙන 2011 දෙසැම්බර් 31 දක්වා රු.480,000 ක් ගෙවා තිබුණි. |

1.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනයේ දිරිදීමනා ගෙවීම් කාර්ය පරිපාටියේ නීතිරීති වලට පටහැනිව පුද්ගලික ආයතනයකින් කාර්මික තාක්ෂණ ආයතනය වෙත කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගත් ලිපිකාරිනියකට 2010 වර්ෂය සඳහා රු.25,350 ක දිරිදීමනා ගෙවීමක් සිදු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ තාවකාලිකව ඇතිවන පරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙන් අනුමැතියකින් තොර රැකියා සපයන පෞද්ගලික ආයතනයකින් සේවකයින් ලබාගෙන ඒ වෙනුවෙන් එම ආයතනයට රු.144,224 ක ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදනය වූ රු. 162,000,000 ගණන් ගැනීමෙන් පසු ආයතනයේ වැඩ කටයුතු වලින් රු.59,318,986 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු.165,000,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.54,631,403 ක අතිරික්තයක් විය. ඒ අනුව පෙර වර්ෂය හා සසදන කළ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,687,583 ක වර්ධනයක් දක්නට ලැබුණි. මේ සඳහා ආයතනයේ ඉපයීම්වල වර්ධනය බලපා ඇත.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දී ආයතනය මෙහෙයුම් කටයුතු වලින් ඉපයූ මුළු ආදායම රුපියල් මිලියන 148.4 ක් වූ අතර,ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ආදායම රුපියල් මිලියන 138ක් විය.විස්තර පහත දැක්වේ.

| | 2011<br>(රු.මි.) | 2010<br>(රු.මි.) |
|---|---|---|
| ප්‍රමිත සේවා | 110.87 | 102.9 |
| උපදේශක සේවා | 8.01 | 4.5 |
| තාක්ෂණ හුවමාරුව | 1.7 | 1.5 |
| ගිවිසුම්ගත ව්‍යාපෘති | 4.5 | 5.8 |
| වර්ණනාත්මක සේවා | 7.0 | 7.0 |
| පුහුණුව | 5.9 | 5.9 |
| පුස්තකාල ආදායම් | 0.4 | 0.3 |
| වෙනත් | 10.04 | 10.00 |
| | 148.4 | 138.0 |

**පහත සඳහන් නිරීක්ෂණයන් ද කරනු ලැබේ.**

(අ) **ප්‍රවර්තන වර්ෂයේ හා පෙර වර්ෂයේ මෙහෙයුම් වියදම් පිළිවෙලින් රුපයල් මිලියන 386.9 ක් හා රුපියල් මිලියන 331.6 ක් විය.**

(ආ) **ප්‍රවර්තන වර්ෂයේ හා පෙර වර්ෂයේ මෙහෙයුම් වියදම්, මෙහෙයුම් ආදායම්වලින් පියවාගත හැකි වී ඇත්තේ පිළිවෙලින් 39% ක් හා 35 % ක් පමණි.**

(ඇ) **ඉහත සඳහන් එක් එක් මෙහෙයුම් සේවාවන් සඳහා වූ පිරිවැය වෙන වෙනම ගිණුම් ගත කිරීමේ ක්‍රමයක් ආයතනය තුල ක්‍රියාත්මකව නොතිබීම නිසා එක් එක් විෂයයෙහි ලාභදායිතාවය ගණනය කළ නොහැකි විය.**

3. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

( අ ) **වත්කම් සත්‍යාපනයේදී හඳුනාගෙන තිබුණු රු.1,092,428 ක වත්කම් ඌණතාවය සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබුණි. වත්කම් සත්‍යාපනයේදී හඳුනා නොගත් වත්කම් නැවත පරීක්ෂා කිරීම සඳහා අදාල අංශ වෙත යොමුකර ඇති බව සභාපතිවරයා දැණුම්දී ඇත.**

(ආ ) **ආයතනයේ නිලධාරීන්ගේ පුහුණුවීම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා පටිපාටියක් අනුගමනය කර නොතිබුණි.**

3.2 **අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

**සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 34 ක ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ඒවා සඳහා ඇස්තමේන්තු කළ මුදල රු. මිලියන 36.02 ක් වූ අතර තථ්‍ය වියදම රු. මිලියන 7.405 ක් වූයෙන් ඌන උපයෝජනය රු. මිලියන 28.615 ක් විය. එක් එක් ව්‍යාපෘතිවල ඌන උපයෝජිත ප්‍රතිශතය 0 % සිට 44 % අතර පරාසයක විය. භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රමාදවී ලැබීම මීට ප්‍රබල හේතුවක් බවද නිරීක්ෂණය විය.**

3.3 **නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

------------------------------------------

(අ) සෙන්ටෙක් ව්‍යාපෘතිය සඳහා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් සපයන ලද රු.1,672,550 ක මුදලින් රු.619,840 ක් 2010 ඔක්තෝබර් 15 දින සිට ගිණුම් අංක 0000351567 යටතේ ඉතිරිව තිබුණු අතර ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට ලබාදෙන ලද මුදලින් 37% ක මුදලක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) රු.1,824,010 ක වටිනාකම ඇති ජංගම ගිණුම් 5 ක් 2011 ජනවාරි සිට අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) වටිනාකම රු. 1,404,922ක් වූ පාරිභෝගික තොග අයිතම 15ක් පරීක්ෂා කිරීමෙන් පසුව ඉන් 6 ක් 2009 වර්ෂයේ සිට චලනය නොවූ තොග ලෙස නිරීක්ෂණය වූ අතර ඒවායේ වටිනාකම රු.497, 842 ක් විය. ආනයනයේදී වන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා මෙම අත්‍යාවශ්‍ය තොග රඳවා තබාගන්නා බව සභාපතිවරයා දැණුම්දී ඇත.

3.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

--------------------------

( අ) කළමනාකරණ චක්‍රලේඛ අංක 30 ට අදාල සේවක වැටුප් පරිවර්තනය කිරීම, පිළිබඳව කටයුතු කළයුතු නිලධාරියා එම කාර්ය ඉටුනොකර තිබියදීත්, එම නිලධාරියා විශ්‍රාම යාමෙන් පසුව වැටුප් පරිවර්තන කාර්ය සඳහා නැවත මාස 04 ක කාලයකට රු.147,660 ක දීමනාවක් ගෙවා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණද, එම නිලධාරියා වැටුප් පරිවර්තන කටයුතු සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුණි.

(ආ) රාජ්‍ය සේවකයින්ට පුහුණු පාඨමාලා ලබාගැනීම සඳහා විශේෂ ප්‍රාගුණ්‍යය සහිත රජය පිළිගත් ආයතන තිබියදී ආයතනයේ සේවකයන්ගේ ඉංග්‍රිසි දැනුම දියුණු කිරීම සඳහා විශේෂඥ ප්‍රාගුණ්‍යක් නොමැති ආයතනයක් වෙත රු.720,000 ක් ගෙවා තිබුණි.

( ඇ) ආයතනය විසින් නිලධාරීන් සඳහා ලබාදුන් පුහුණුවකට අදාල නිලධාරීන්ගේ සහභාගිත්වය දුර්වල තත්වයක පැවති බැවින් පුහුණුව සඳහා ගෙවූ මුදලින් රු.53,048 ක වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

3.5 **හඳුනාගන්නා ලද පාඩු**

---------------------

**පහත අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.**

( අ ) **ආයතනයේ තොග සත්‍යාපනය පැවරුම පිරිනැමීමේදී අඩුම මිල තෝරා නොගෙන වැඩි මිලක් ඉදිරිපත් කළ ආයතනයක් තෝරා ගැනීම නිසා රු.92,720 ක අලාභයක් සිදු වී තිබුණි.**

( ආ ) **වගකීම් කාලය ඉක්ම නොවූ පරිගණක සේවා කිරීම වෙනුවෙන් රු.73,718 ක වියදමක් දරා තිබුණි.**

(ඇ) **ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇති රු. 110,200,000 ට අදාල පොලිය ගෙවීමේදී බැංකුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.599,085 ක මුදලක් පොලී ගෙවන අවස්ථාවේදී බැංකුව විසින් රඳවා ගැනීමේ බදු වශයෙන් අඩුකර දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර තිබුණි.**

4. **පද්ධති හා පාලන**

------------------

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.**

**<u>පද්ධති හා පාලන ක්ෂේත්‍රයන්</u>**

(අ) **බදවාගැනීම්**

(ආ) **තැපැල් වියදම්**

(ඇ) **පුහුණු කිරීම්**

(ඈ) **මිලදී ගැනීම්**